පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය: 290

ආයතනයේ නම: **වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය**

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்: 290

நிறுவனத்தின் பெயர்: **தோட்ட வீடமைப்பு மற்றும் சமுதாய உட்கட்டமைப்பு வசதிகள் இராஜாங்க அமைச்சு**

பாராளுமன்றத்தின் அரச கணக்கு குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Parliamentary Series No : 290

Name of the Institution: **State Ministry of Estate Housing and Community Infrastructure**

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No.119(4)

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක **290**

ආයතනයේ නම : වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය

පළමු කොටස

අනු අංකය	කම්ටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු / කම්ටුව විසින් ලබා දී ඇති නියෝග	අඩුපාඩු /වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග
01	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් බොහෝ ප්‍රමාණයකට මසකට අඩු කාලයක් තුල පිළිතුරු ඉදිරිපත් කර ඇති අතර, ඇතැම් විගණන විමසුම් සඳහා ප්‍රායෝගික ගැටලු මතු වීම හේතුවෙන් මසක් ඇතුලත පිළිතුරු සැපයීමට නොහැකි විය.එමෙන්ම 2021 වර්ෂයේ පැවති කොරෝනා වසංගත තත්වය හේතුකොටගෙන කාර්ය මණ්ඩලයේ පැමිණීම සීමා වීමද පිළිතුරු සැපයීම ප්‍රමාද වීමට හේතුවක් විය. මේ වන විට විගණන විමසුම් සඳහා මසකට අඩු කාලයක් තුල පිළිතුරු සැපයීමට කටයුතු කරන බව දන්වා සිටිමි.
02	2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍ර ලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත්කර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දන්වා නොතිබුණි.	2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වී.අරුල්රාජා මහත්මිය පත්කර ඇති අතර ඒ පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත දැන්වීමට කටයුතු කර ඇත.
03	2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ..756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2021.12.31 ට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර අදාල කටයුතු සිදුකල අතර ඇතිවූ ප්‍රායෝගික ගැටලු නිසා 2021 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සකස් කිරීම ප්‍රමාද විය.මේ නිසා එම වාර්තාව නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. නමුත් මේ වන විට 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු සිදුකරන බව කාරුණිකව දැනුම් දෙමි.
04	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණ වූ අතිරික්ත,ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	අදාල කාල සීමාවේ ඇතිවූ නොයෙකුත් ප්‍රායෝගික දුෂ්කරතා හේතුවෙන් නියමිත කාල වකවානු තුල අදාල නිර්දේශ ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව පිළිගන්නා අතර මින් ඉදිරියට එම නිර්දේශ නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

A.C.M. Nafeel
Secretary
Ministry of Water Supply and Estate Infrastructure Develop
No: 45, St. Michael's Road,
Colombo 03.

05	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබිණ.	සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කරමින් පවතී.
06	ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දැරීම සිදුව තිබුණි.මු.රෙ. 94 (1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන තිබුණි.	රාජ්‍ය ගිණුම් කාරක සභා ඇගයීම් පත්‍රිකාව සලකුණු කිරීමේදී ප්‍රතිපාදන උපයෝජනය යටතේ පිළිතුරු තෝරාගැනීමේදී අතපසුවීමකින් ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැඳීම් ඇතිකරගෙන ඇතිබව සනාථවන පිළිතුර තෝරාගෙන ඇති නමුත් අදාල වර්ෂයේදී ප්‍රතිපාදන සීමාව ඉක්මවා ගෙවීම් කටයුතු සිදුකර නොමැත.
07	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	සංවර්ධන ව්‍යාපෘති වලට අදාලව රැඳවුම් මුදල් නිදහස් කිරීමේදී එම ව්‍යාපෘතීන්හි වැඩ සම්පූර්ණයෙන් අවසන් විය යුතුය.නමුත් ඇතැම් ව්‍යාපෘති එසේ නියමිත කාල වකවානුවල නිම කිරීමට නොහැකි වී ඇත.එමෙන්ම ඇතැම් ව්‍යාපෘති සම්බන්ධයෙන් රැඳවුම් මුදල් නිදහස් කරන මෙන් ඉල්ලීම් ඉදිරිපත් කිරීම ප්‍රමාද වේ.මෙවැනි ප්‍රායෝගික කාරණා හේතුකොට ගෙන මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කිරීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. නමුත් මේ වන විට නිදහස් කල හැකි සියලු තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර ඇති බව දන්වා සිටිමි.තවදුරටත් වැඩ අවසන් නොවූ ව්‍යාපෘති වල වැඩ අවසන් අදියරයන්හි ගෙවීම් වලට අදාල රැඳවුම් මුදල් ලෙස රු.5,405,513.87 ක මුදලක් පමණක් 2023/12/31 වන විට පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා ඇති බව ව දන්වා සිටිමි. අංක අමප/22/1996/618/045 හා 2023 ජනවාරි මස 03 දින දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මෙතෙක් වැඩ අවසන් නොවූ ව්‍යාපෘති වල ඉතිරි කොටස් නිම කිරීම මේ වසරේදී සිදුකරන අතර එම කොටස් නිම වූ පසු දැනට ඉතිරි වී ඇති තැන්පත් මුදල්ද නිදහස් කරන බව කාරුණිකව දන්වා සිටිමි.
08	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	ලබාදෙනු ලබන අග්‍රිම අත්තිකාරම් මසක් ඇතුලත පියවන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇති අතර මේ වන විට ලබාගන්නා සියලු අග්‍රිම අත්තිකාරම් කාර්යය නිම වී මසක් ඇතුලත නිරවුල් කරන බව දන්වා සිටිමි.
09	මු.රෙ.371 හි වන සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.	මු.රෙ.371 හි වන සීමාවට අදාලව තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කරන අතර සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් නොකරන බව කාරුණිකව දන්වා සිටිමි.
10	අනුමත සීමාව ඉක්මවා කාර්යමණ්ඩලය බඳවාගෙන තිබුණි.	2019 වර්ෂයේ අදියර II හා III වශයෙන් බඳවාගෙන ඇති උපාධිධාරී අභ්‍යාසලාභීන්, සංවර්ධන නිලධාරී

A.C.M. Nafeel
Secretary
Ministry of Water Supply and Estate Infrastructure Development
No: 45, St. Michael's Road,
Colombo 03.

		සේවයේ III ශ්‍රේණියේ තනතුරු වලට 2021.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කර ඇත. මෙම පත්කිරීම්වලට අදාලව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක: CS/DOS/Policy/01/01/(iii) හා 2021.03.26 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව අනුමත කාර්යමණ්ඩලයට පරිබාහිරව අනාපේක්ෂිතව අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩලය සඳහා චක්‍රලේඛයේ 06 i වගන්තිය ප්‍රකාර නව තනතුරු ඇතිකර ගැනීම සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගන්නා ලෙස දන්වා ඇත. රාජ්‍ය සේවයට උපාධිධාරී අභ්‍යාසලාභීන් සංවර්ධන නිලධාරීන් ලෙ අනුයුක්ත කිරීමේදී සේවා ස්ථාන වල අනුමත කාර්ය මණ්ඩල සීමාව ඉක්මවා නිලධාරීන් අනුයුක්ත කිරීමට අනුමත කර ඇත. මෙම අමාත්‍යාංශය සඳහා ඒවකට තනතුරු 19 ක් අනුමතව පැවති අතර සංවර්ධන නිලධාරීන් 175 දෙනෙකු අනුයුක්ත කිරීමට කටයුතු කරනු ලැබිය. කෙසේ නමුදු මෙම අමාත්‍යාංශයේ සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන, සේවා අවශ්‍යතා පදනම්ව අනුමතව පැවති තනතුරු 19 ද ඇතුළත්ව සංවර්ධන නිලධාරී සේවයේ අනුමත මුළු සංඛ්‍යාව 65 ක් වශයෙන් අනුමතව ඇත. . ඒ අනුව මේ වන විට අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලයක් නොමැති බව සඳහන් කරමි. (කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් කාර්ය මණ්ඩලය අනුමත කරන ලද අංක: DMS/CM/18 හා 2023.03.29 දිනැති ලිපියේ පිටපතක් සහ 2023.12.31 දිනට මෙම අංශයේ කාර්ය මණ්ඩලයේ පිටපතක් මේ සමග අමුණා ඇත).

A.C.M. Nafeel
Secretary
Ministry of Water Supply and Estate Infrastructure Development
No: 45, St. Michael's Road,
Colombo 03.

දෙවැනි කොටස

අනු අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු / කමිටුව විසින් ලබා දී ඇති නියෝග	අඩුපාඩු /වක්මන් තක්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග
01	ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබිණි.	මේ වන විට තොරතුරු ඉල්ලීම් සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති අභියාචනා ලේඛනගත කිරීම සඳහා ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි. ඒසේම මේ දක්වා ඉදිරිපත් කරන ලද සියලුම තොරතුරු ඉල්ලීම් අභියාචනා අවසන් කර ඇත.
02	සැළසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතිණ.	2020 වර්ෂයේ මාර්තු මස සිට රටේ පැවති කොරෝනා වසංගත තත්වය මත අපේක්ෂිත පරිදි පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය. ඊට හේතු වූ කරුණු වශයෙන් රට තුල සංචරන සීමා පැනවීම නිසා කාර්ය මණ්ඩලය අත්‍යාවශ්‍ය සේවා සඳහා පමණක් කැඳවීම,සෞඛ්‍ය හේතූන්මත ඒකරාශිවීම සම්බන්ධයෙන් පනවා තිබූ සීමාවන් සඳහන් කල හැකිය. අංක 01/2023 දරණ අයවැය වක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුව සේවා ව්‍යවස්ථා, බඳවා ගැනීම් පටිපාටි හා වක්‍රලේඛ විධි විධාන පරිදි නිලධාරීන් අනිවාර්යයෙන්ම සහභාගී විය යුතු පුහුණු අවස්ථා පමණක් ලබාදිය යුතු බැවින් අනෙකුත් පාඨමාලා සම්පාදනය කිරීම තාවකාලිකව නැවතී ඇති බව සඳහන් කරමි.

A.C.M. Nafeel
Secretary
Ministry of Water Supply and Estate Infrastructure Development
No: 45, St. Michael's Road,
Colombo 03.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

முகாமைத்துவ சேவைகள் திணைக்களம்

DEPARTMENT OF MANAGEMENT SERVICES

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහා භාණ්ඩාගාරය, කොළඹ 01. | பொது திறைசேரி, கொழும்பு 01. | General Treasury, Colombo 01.

ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය

10 APR 2023

මගේ අංකය எனது இல. My No.	DMS/CM/18	ඔබේ අංකය உமது இல. Your No.	ADM/01/22/05	දිනය திகதி Date	2023.03.[illegible]

Adm/01

1-වන ඡායාරූපිය හා ඉදිරිපත් කිරීම පරිශීලනය සඳහා ඉදිරිපත් කරමි.

2. නිවාඩු නොගෙන නිවාඩු කාරිසු නොවෙමි.

7/4/23

ලේකම්

ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය

ලේකම්තුමනි

ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය සඳහා තනතුරු අනුමත කිරීම

ඉහත කරුණට අදාල ඔබගේ සමාංක හා 2022.12.22 දිනැති හා 2023.02.22 දිනැති ලිපි සහ 2023.02.01 දින මෙම දෙපාර්තමේන්තුවේදී පැවති සාකච්ඡාව හා බැඳේ.

02. ඉහත සාකච්ඡාවේදී ඔබ විසින් ඉදිරිපත් කරන ලද කරුණු හා අංක අමප 22/1698/605/023 හා 2022.11.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2315/35 හා 2023.01.19 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ස්ථාපිත කරන ලද ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය සඳහා ඇමුණුම iහි සඳහන් තනතුරු අනුමත කරමි.

03. මෙම තනතුරු අනුමත කිරීමත් සමඟම, ඔබ අමාත්‍යාංශයේ විෂය පථයට අදාලව තනතුරු අනුමත කරමින් මීට පෙර නිකුත් කරන ලද සියලු ම ලිපි අවලංගු වේ. එසේම, ඇමුණුම Iහි පරිදි අනුමත තනතුරු සඳහා බඳවා ගැනීම/ අනුයුක්ත කිරීම අදාළ අනුමත සේවා ව්‍යවස්ථා/බඳවා ගැනීම් පරිපාටිවල සඳහන් විධි විධාන වලට අනුකූලව සිදු කළ යුතු වන අතර, ඉහත අනුමත තනතුරු වලට පරිබාහිරව කිසිදු තනතුරක් සඳහා බඳවා ගැනීම් / අනුයුක්ත කර ගැනීම් සිදු නොකළ යුතුය.

04. අනුමත ලේඛනයේ ඇතුලත් තනතුරු නාම, ශ්‍රේණි සහ වැටුප් කේතවලට පරිබාහිරව වෙනත් තනතුරු නාම, ශ්‍රේණි හා වැටුප් කේත භාවිතා නොකළ යුතු වන අතර, මෙම අනුමත කාර්ය මණ්ඩලය සම්බන්ධව යම් සංශෝධනයක් සිදු කළ යුතු වන්නේ නම් ඒ සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ.

05. එසේම "රාජ්‍ය අංශයේ කාර්යමණ්ඩල තොරතුරු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම" මැයෙන් වූ කළමනාකරණ සේවා වක්‍රලේඛ අංක 04/2017 හි සඳහන් පරිදි ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ තත්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු සෑම වර්ෂයකම එක් එක් කාර්තුව අවසානයේ මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වේ.

ලලීන්ද ගමගේ
අතිරේක ලේකම් (පාලන)
ජල සම්පාදන අමාත්‍යාංශය
නො.353, "ලක්දිව මැදුර", නව පාර්ලිමේන්තු
පාර, පැලවත්ත, බත්තරමුල්ල.

True Copy

06. එමෙන්ම "විවක්ෂණශීලීව රාජ්‍ය විෂයමූ පාලනය කිරීම" යන මැයෙන් ඉදිරිපත් කරන ලද අංක අමප 22/0178/304/014 හා 2022.02.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය, "රාජ්‍ය විෂයමූ පාලනය කිරීම" මැයෙන් නිකුත් කරන ලද 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022, "විෂයමූ පාලනය" මැයෙන් නිකුත් කරන ලද 2023.02.02 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 02/2023 හා 2022.08.15 දිනැතිව ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක PS/SB/Circular/10/2022 කෙරෙහි ද අවධානය යොමු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

මෙයට - විශ්වාසී

හිරන්සා කළුතන්ත්‍රි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :

1. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
2. විගණකාධිපති
3. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව
4. ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව
5. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
6. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
7. අධ්‍යක්ෂ,පරිපාලන සේවා / ක්‍රම සම්පාදන සේවා/ ගණකාධිකාරී සේවා/ ඉංජිනේරු සේවා අංශය
8. පොදු ගොනුව
9. දත්ත ගොනුව

True Copy

ලලීන්ද්‍ර ගමගේ
අතිරේක ලේකම් (පාලන)
ප්‍රථ සම්පාදන අමාත්‍යාංශය
කොඩ්ඩ, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු
පාර, පැලවත්ත, බත්තරමුල්ල.

ඇමුණුම - I

ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය සඳහා අනුමත කාර්ය මණ්ඩලය

අනු අංකය	තනතුරු නාමය	අදාළ වන සේවය	ශ්‍රේණිය / පන්තිය	වැටුප් ක්‍රමය (රා.ප.ව. 03/2016 අනුව)	අනුමත තනතුරු සංඛ්‍යාව		අනුමත මුළු තනතුරු සංඛ්‍යාව
					ජල සම්පාදන අංශය	වතු යටිතල පහසුකම් සංවර්ධන අංශය	
1	ලේකම්	–	–	SL 4	1		1
2	අතිරේක ලේකම්	ශ්‍රී ලං.ප.සේ.	විශේෂ	SL 3	2	2	4
3	අතිරේක ලේකම් *	ශ්‍රී ලං.ඉ.සේ.	විශේෂ	SL 3	1	–	1
4	අධ්‍යක්ෂ ජනරාල් **	ශ්‍රී ලං.ඉ.සේ.	විශේෂ	SL 3	1	1	2
5	අධ්‍යක්ෂ ජනරාල් ***	ශ්‍රී ලං.ක්‍ර.සේ.	විශේෂ	SL 3	2	1	3
6	ප්‍රධාන මූල්‍ය නිලධාරී	ශ්‍රී ලං.ග.සේ.	විශේෂ	SL 3	1	–	1
7	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	ශ්‍රී ලං.ප.සේ.	I	SL 1	1	1	2
8	ප්‍රධාන ගණකාධිකාරී	ශ්‍රී ලං.ග.සේ.	I	SL 1	1	1	2
9	ප්‍රධාන අභ්‍යන්තර විගණක	ශ්‍රී ලං.ග.සේ.	I	SL 1	1	1	2
10	අධ්‍යක්ෂ	ශ්‍රී ලං.ප.සේ.	I	SL 1	2	1	3
11	අධ්‍යක්ෂ	ශ්‍රී ලං.ක්‍ර.සේ.	I	SL 1	1	1	2
12	අධ්‍යක්ෂ	ශ්‍රී ලං.ඉ.සේ.	I	SL 1	2	1	3
13	සහකාර ලේකම්	ශ්‍රී ලං.ප.සේ.	III/II	SL 1	1	1	2
14	ගණකාධිකාරී	ශ්‍රී ලං.ග.සේ.	III/II	SL 1	2	2	4
15	අභ්‍යන්තර විගණක	ශ්‍රී ලං.ග.සේ.	III/II	SL 1	1	1	2
16	සහකාර අධ්‍යක්ෂ /නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී ලං.ප.සේ.	III/II	SL 1	2	2	4
17	සහකාර අධ්‍යක්ෂ /නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී ලං.ක්‍ර.සේ.	III/II	SL 1	2	2	4
18	සහකාර අධ්‍යක්ෂ /නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී ලං.ඉ.සේ.	III/II	SL 1	5	2	7
19	සහකාර අධ්‍යක්ෂ *	ශ්‍රී ලං.ක්‍ර.සේ. (අධිසේවක)	I - III	SL 1	2	1	3
20	නීති නිලධාරී	දෙපාර්තමේන්තුගත	III/II	SL 1	1	0	1
21	පරිපාලන නිලධාරී	ක.සේ.නි.සේ.	අධි පන්තිය	MN 7	1	1	2
22	භාෂා පරිවර්තක	භාෂා පරිවර්තක සේවය	I /විශේෂ	MN 6	2	2	4
23	ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්	තාවකාලික	–	රු.41,410.00 (මාසික) රා.ප.ව. අංක 03/2016 හි උපලේඛන iv අනුව	1	–	1
24	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී	ශ්‍රී ලං.තො. හා සං. තා.සේ.	3 - III/II/I	MN 6	–	1	1

True Copy

ඉඳුනිල් ගමගේ
පරිපාලන නිලධාරී (නාමික)

අනු අංකය	තනතුරු නාමය	අදාළ වන සේවය	ශ්‍රේණිය / පන්තිය	වැටුප් ක්‍රමය (රා.ප.ව. 03/2016 අනුව)	අනුමත තනතුරු සංඛ්‍යාව		අනුමත මුළු තනතුරු සංඛ්‍යාව
					ජල සම්පාදන අංශය	වක්‍ර යටිතල පහසුකම් සංවර්ධන අංශය	
25	සංවර්ධන නිලධාරී	සං. නි. සේ.	III/II/I	MN 4	57	65	122
26	තාක්ෂණ නිලධාරී	ශ්‍රී ලං.තා.සේ.	III/II/I	MN 3	–	4	4
27	කළමනාකරණ සේවා නිලධාරී	ක.සේ. නි. සේ.	III/II/I	MN 2	25	11	36
28	වැව්ලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සපයන්නා *	දෙපාර්තමේන්තුගත	–	MN 1	–	212	212
29	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	ශ්‍රී ලං.තො. හා සං. තා.සේ.	3 පන්තියේ III ශ්‍රේණිය	MT 1	1	1	2
30	රියදුරු	ඒකාබද්ධ රියදුරු සේවය	III/ II/I/ විශේෂ	PL 3	14	10	24
31	කාර්යාල කාර්ය සහායක	කා.සේ.සේ.	III/ II/I විශේෂ	PL 1	19	13	32
32	වීඩියෝ කැමරා ශිල්පී	තාවකාලික	–	රු.29,840.00 + රු. 7800/- (මාසික)	1	–	1
33	වීඩියෝ කැමරා ශිල්පී සහායක	තාවකාලික	–	රු.24,250.00 + රු. 7800/- (මාසික)	1	–	1
එකතුව					**153**	**341**	**494**

* මෙම තනතුර දරන්නාට පුද්ගලික වන සේ හා පසුව අහෝසිවීමට යටත්ව අනුමත කරනු ලැබේ.

** ජල සම්පාදන අංශය සඳහා දරන්නාට පුද්ගලික වන සේ අනුමත ශ්‍රී ලං.ඉ.සේ. අතිරේක ලේකම් තනතුර අහෝසි වීමෙන් අනතුරුව පමණක් ශ්‍රී ලං.ඉ.සේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා බඳවා ගැනීම් කළ යුතුය. එතෙක් ශ්‍රී ලං.ඉ.සේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර අවුරා තබනු ලැබේ.

*** ජල සම්පාදන අංශය සඳහා අනුමත ශ්‍රී ලං.ක්‍ර.සේ. එක් අධ්‍යක්ෂ ජනරාල් තනතුරක් 2023 වර්ෂයේදී නිලධාරියෙකු විශ්‍රාම යාම ත්තුවෙන් පුරප්පාඩු වීමට නියමිත බැවින්, එම තනතුර දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කරනු ලබන අතර, අනෙක් තනතුර ස්ථිර පදනමින් අනුමත කරනු ලැබේ.

True Copy

ලලින්ද හමගේ
අතිරේක ලේකම් (පාලක)
ජල සම්පාදන අමාත්‍යාංශය
කාමර අංක, "ජලදීප මැදුර", නව පාර්ලිමේන්තු
පාර, පැලවත්ත, බත්තරමුල්ල.